# වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

## තනතුරු පුරප්පාඩු

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) තනතුරේ** පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති)**

කළමනාකාර සේවා ගණය (HM 1-1)

**වයස** : වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**වැටුප් පරිමාණය** : මෙම තනතුරට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව රු. 80,295 - 15 X 2,270 = 114,345/- (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. මීට අමතරව රජය මගින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 01 හෝ 02)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් කෘෂිකර්මය හෝ වැව්ලි කළමනාකරණය පිලිබඳ මූලික උපාධියක් ලබා තිබීම.

**සමග**

තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිලිගත් පශ්චාත් උපාධි ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම/ පිලිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක කෘෂි ව්‍යාප්ති කටයුතු වලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයට ගැළපෙන්නාවූ, පිලිගත් වරලත් වෘත්තිය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක කෘෂි ව්‍යාප්ති කටයුතු වලට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම (පහත 01 හෝ 02)**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
02. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සංවර්ධන / ව්‍යාප්ති කටයුතු පිලිබඳව කළමනාකාර (MM 1-1) සේවා ගණයෙහි I වන ශ්‍රේණියේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**බඳවාගැනීමේ ක්‍රමය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදුකරන අතර ලකුණු ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| I. | අදාළ අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| II. | අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | - ලකුණු 30 |
| III. | අනෙකුත් කාර්ය සාධනයන් සහ කුසලතා | - ලකුණු 15 |
| IV. | සම්මුඛ පරීක්ෂණයේදී කාර්ය සාධනය | - ලකුණු 25 |
| | **එකතුව** | **- ලකුණු 100** |

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගනු ලැබේ.

**වෙනත්** : සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**අමතර ප්‍රතිලාභ** : නේවාසික හා බාහිර වෛද්‍යාධාර යෝජනා ක්‍රමය යටතේ පහසුකම්.

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතට හෝ එකී පනත යටතේ ඇති සේවකයන්ගේ වෙනත් අර්ථසාධක අරමුදලකට හෝ තෝරාගනු ලබන අයදුම්කරු විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ සේවය කරන සම්පූර්ණ කාලය තුළදී ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් හා ජීවන වියදම් දීමනාවෙන් මාසිකව 10% කට නොඅඩු මුදලක් ප්‍රදානය කරනු ලබන අතර අධිකාරිය විසින් 15% කට නොඅඩු මුදලක් සාමාජික මුදල් වශයෙන් ගෙවනු ඇත.

ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා 3%ක් අධිකාරිය විසින් ගෙවනු ලැබේ.

**අයදුම්පත්** : අයදුම්කරුවන් සියලු විස්තර සමග තම අයදුම්පත් උප්පැන්න සහතික, අධ්‍යාපන සහතික, පළපුරුද්ද දක්වෙන සහතික හා අනෙකුත් කාර්ය සාධනයන් සහ කුසලතාවලට අදාළ සහතික යන සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය / රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුක්තවූවන් තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඔහුගේ නිර්දේශ සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

**අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :**

2023 ජනවාරි මස 25 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති,**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

Source: Dinamina, Daily News (2023.01.12)